# බස්නාහිර පළාත් සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම.

**(අ) පළාත් සභා අරමුදල් ගිණුම**

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2013 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

**(ආ) අනෙකුත් ගිණුම්**

2013 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

**2012 දෙසැම්බර් 31 දිනට**

| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i). | විසර්ජන ගිණුම් | 26 | 26 | - |
| (ii). | ආදායම් ගිණුම් | 28 | 28 | - |
| (iii). | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 42 | 42 | - |
| (iv). | වානිජ අත්තිකාරම් ගිණුම් | 02 | 02 | - |
| (v). | වෙනත් අත්තිකාරම් ගිණුම් | 05 | 05 | - |
| (vi). | අරමුදල් ගිණුම් | 06 | 06 | - |
| (vii). | ප්‍රඥප්ති ගිණුම් | 09 | 08 | 01 |

### 1.2.2 ගිණුම් නොසැසඳීම්

ඒ ඒ දෙපාර්තමේන්තුවලින් ඉදිරිපත් කරන ලද ගිණුම් හා පළාත් සභා අරමුදල් ගිණුම (පළාත් භාණ්ඩාගාර පොත්) අතර පහත දැක්වෙන වෙනස්කම් තිබුණි.

| ගිණුම් විස්තරය | ඒ ඒ දෙපාර්තමේන්තු වල ගිණුම් අනුව ශේෂය | පළාත් සභා අරමුදල් ගිණුම අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අග්‍රිම ගිණුම් 19 ක් | 14,939,800 | 619,018,718 | (604,078,918) |
| පොදු තැන්පත් ගිණුම් 04 ක් | 94,159,105 | 87,857,399 | 6,301,706 |
| පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 05 ක් | 168,041,726 | 172,041,244 | (3,999,518) |
| අනෙකුත් අත්තිකාරම් ගිණුම් 02ක් | 4,692,401 | (7,281,945) | 11,974,346 |
| ප්‍රේෂණ ගිණුම් 19 ක් | 24,005,787 | (63,628,490) | 87,634,277 |
| ආදායම් ගිණුම් 02 ක් | 13,367,767 | 12,800,576 | 567,191 |

### 1.2.3 අත්හැරීම්

ආදායම් රැස්කිරීමේ ගිණුම අනුව 2012 ජූලි සිට දෙසැම්බර් දක්වා බනිජ බදු වශයෙන් ලැබී තිබූ රු.1,787,995 ක් ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

### 1.2.4 ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම

පළාත් සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ස්ථාවර වත්කම් දක්වා නොතිබුණු අතර එවැනි වත්කම් ඇති බවට මූල්‍ය ප්‍රකාශන සටහන්වලින්ද හෙළිදරව් කර නොතිබුණි. විගණනය වෙත ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම්වල වූ ජංගම නොවන වත්කම් සංචලන වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු. 1,114,324,874 ක ස්ථාවර වත්කම් පළාත් සභාව සතුව ඇති බව තහවුරු කර තිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

#### පිළිතුරු නොලත් විගණන විමසුම්

පළාත් සභාවේ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 20 කට සහ ඉකුත් වර්ෂයේදී නිකුත් කළ විගණන විමසුම් 04 කට 2013 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**1.2.6 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනතේ 3 වගන්තියෙන් හා 1985 අංක 1 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනතේ 9(2) වගන්තියෙන් සංශෝධනය වූ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 16 හා 47 වගන්ති. | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ආරම්භ කළ, 1995 වර්ෂයේ සිට 2012 වර්ෂයේ ඔක්තෝබර් මාසය දක්වා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමේදී දීමනා හැර මූලික වැටුප පදනම් කරගෙන දායක මුදල් ගණනය කර තිබූ අතර සේව්‍යයා හා සේවකයා යන දෙපාර්ශවයෙන්ම 2011 වර්ෂය වෙනුවෙන් රු. 11,242,973 ක් ද, 2012 වර්ෂයේ ඔක්තෝබර් මාසය දක්වා රු. 11,603,624 ක් ද, ලෙස එම වර්ෂ දෙක සඳහා පමණක් රු.22,846,597 ක් ගෙවිය යුතුව තිබුණි. උක්ත වගකීමට අමතරව 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව සියයට 5 සිට සියයට 50 දක්වා වූ දඩ මුදලකට ද අධිකාරිය යටත්වනු ඇත. |
| (ආ)2002 දෙසැම්බර් 04 දිනැති අංක එච්ආර්ඩී/පීපීඑම්/2002/30 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය හා ගුණාත්මක යෙදවුම් පිළිබඳ මාර්ගෝපදේශ අත්පොතේ 21.1 වගන්තිය. | පාසල් වෙත නිකුත් කර තිබූ මුදල් අප්‍රමාදව ඒ ඒ කාර්යයන් සඳහා යෙදවිය යුතු වූවත් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය යටතේ ඇති පාසල් හතළිස් හයක ගුණාත්මක යෙදවුම් ගිණුම්වල පාවිච්චි නොකළ ශේෂයන්හි එකතුව රු. 15,751,828 ක් විය. 2013 පෙබරවාරි 18 දින වන විටත් එම මුදල් ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර මින් පාසල් 10 ක ගුණාත්මක යෙදවුම් ගිණුම්වල ශේෂය රු. 500,000 ඉක්මවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.3 වගන්තිය. | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වූවත්, ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ පාසල් විස්සක (20) ගුරු සේවයේ නිලධාරීන් දිගු කාලයක් තිස්සේ විදුහල්පති තනතුරුවල රාජකාරී ආවරණය කරනු ලබන බව |

නිරීක්ෂණය විය.

## 2. ආදායම් හා වියදම් කළමනාකරණය

### 2.1 ආදායම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විචලනයන් සහිත සාරාංශයක් පහත දැක්වේ.

| | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පළාත් සභා විෂයන්ට අදාල ආදායම්** | | | | | | |
| **බදු ආදායම්** | 23,046 | 22,156 | 890 | 19,953 | 21,670 | (1,717) |
| **බදු නොවන ආදායම්** | 2,833 | 3,947 | (1,114) | 1,855 | 2,847 | (992) |
| **රජයේ ප්‍රදාන** | 12,485 | 9,691 | 2,794 | 12,477 | 11,019 | 1,458 |
| **එකතුව** | 38,364 | 35,794 | 2,570 | 34,285 | 35,536 | (1,251) |

### 2.2 වියදම්

| | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| වියදම් | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පෞද්ගලික පඩිනඩි** | 20,931 | 20,486 | 445 | 19,817 | 19,101 | 716 |
| **අනෙකුත්** | 11,165 | 10,872 | 293 | 11,351 | 9,515 | 1,836 |
| **පුනරාවර්තන** | 32,096 | 31,358 | 738 | 31,168 | 28,616 | 2,552 |
| **ප්‍රාග්ධන** | 6,268 | 5,466 | 802 | 3,577 | 3,002 | 575 |
| **එකතුව** | 38,364 | 36,824 | 1,540 | 34,745 | 31,618 | 3,127 |

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන හා මූලධන වියදම් අනුපාතය 6 :1 ක් විය.

## 2.3 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට හා ආසන්නතම ඉකුත් වර්ෂ දෙකක අවසානයට හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | 2012 | 2011 | 2010 |
| | රු. | රු. | රු. |
| බදු ආදායම | 1,138,048,276 | 1,426,690,111 | 1,897,917,733 |
| බදු නොවන ආදායම | 394,127,295 | 1,248,958,145 | 1,086,708,932 |
| එකතුව | 1,532,175,571 | 2,675,648,256 | 2,984,626,665 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 'ආ' උපලේඛණයේ 3 වන නියෝගය අනුව පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වූ ගාස්තු පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව වෙත ගෙවිය යුතු අතර එම ගාස්තුවෙන් සියයට 50 ක් අදාල පළාත් සභාව වෙත නියාමන සභාව විසින් ප්‍රේෂණය කළයුතුව තිබුණත් 2010, 2011 හා 2012 වර්ෂවලට අදාලව කිසිදු ආදායමක් බස්නාහිර පළාත් සභාව වෙත ලැබී නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 1,029,280,733 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 3,918,439,938 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,947,720,671 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.2,742,207,125 කින් හා පළාත් ආයෝජන රු. 2,463,666,745 කින් වැඩිවීම එම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.2 ව්‍යුහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 05 ක වැය විෂයයන් 09 ක් යටතේ සළසා තිබුණු රු.154,589,350 ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ආ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 15 ක වැය විෂයයන් 48 ක් යටතේ සළසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා රු. 26,664,118 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ඇ) වැය ශීර්ෂ 05 ක වැය විෂයයන්වලින් ප්‍රතිපාදන අඩුකර ගැනීමෙන් පසු එම වැය විෂයයන්වලටම නැවත ප්‍රතිපාදන වැඩිකර ගැනීම් අවස්ථා 05 ක් තිබුණි.

## 3.3 අග්‍රිම ගිණුම්

පළාත් සභාවේ, මධ්‍යම රජයේ ප්‍රතිපාදනවලට අදාලව අග්‍රිම ගිණුමක් පවත්වා නොතිබුණි. පළාත් භාණ්ඩාගාර අග්‍රිම පාලන ගිණුම අනුව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් නිරවුල් කළ යුතු අග්‍රිම ශේෂවල එකතුව රු. 454,307,191 ක් විය.

## 3.4 නිරවුල් නොකළ පොදු තැන්පත්

2012 දෙසැම්බර් 31 දිනට පළාත් භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම් ශේෂවල එකතුව රු.798,800,430 ක් වූ අතර, වර්ෂ 02 ක කල්ඉකුත් වූ ආයතන 14 ක එකතුව රු. 10,804,609 ක්වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4. අත්තිකාරම් ගිණුම්

## 4.1 පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම්

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 18 ක ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන්ගෙන් එකතුව රු. 27,571,152 ක ශේෂයක්ද, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් එකතුව රු. 2,752,403 ක ශේෂයක්ද, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් එකතුව රු. 2,603,616 ක ශේෂයක්ද සහ හිටපු හා මියගිය පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් රු. 297,743 ක ශේෂයක්ද වශයෙන් එකතුව රු. 33,224,914 ක හිඟ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත් වී තිබුණි.

## 5. මෙහෙයුම් සමාලෝචනය

### 5.1 කාර්ය සාධනය

#### 5.1.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබු ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | ලැබී තිබු ප්‍රදානය | උපයෝජනය | ඉතිරිය / (අතිරික්තය) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| (i) උපමාන පාදක ප්‍රදාන | 180,410,000 | 797,355,489 | (616,945,489) |
| (ii) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 405,000,000 | 1,642,649,744 | (1,237,649,744) |
| (iii) සාමුහික ප්‍රදාන | 86,000,000 | 101,041,541 | (15,041,541) |
| (iii) වෙනත් ප්‍රදාන | | | |
| ලෝක බැංකු ආධාර - අධ්‍යාපන | 126,000,000 | - | 126,000,000 |

#### 5.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහාවු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 5,062.46 ක ඇස්තමේන්තු අගයකට වු යෝජනා 8829 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|
| (අ) සම්පුර්ණයෙන් නිම කළ | 8248 | 171 | 8419 |
| (ආ) 50% කට වඩා අඩුවෙන් නිම කළ | 130 | - | 130 |
| (ඇ) 50% කට වඩා වැඩියෙන් නිම කළ | 132 | - | 132 |
| (ඇ) ආරම්භකර නොතිබු | 145 | 01 | 146 |
| (ඉ) මත භේදයට/ ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වු | 02 | - | 02 |
| | 8657 | 172 | 8829 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් ප්‍රතිපාදන සළසාගෙන වැය දැරිය යුතු ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් සඳහා පළාත් සංවර්ධන සැලැස්මේ උපමාන පාදක හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘති අංකයන් යටතේ ප්‍රතිපාදන සළසාගෙන වැය කර තිබුණි.

(ආ) 2007 අංක 01 දරන බස්නාහිර පළාත් සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තිය 11 කොටසේ 7 (2) වගන්තිය අනුව පළාතේ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවලින් පරිසරයට එකතුවන අපද්‍රව්‍ය උපරිම ලෙස වලක්වා පළාතේ මහජනයාගේ මෙන්ම සතුන් හා වෘක්ෂලතා ආදියේද යහපත සඳහා පරිසරය පිරිසිදුව තබා ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන සැළසීම අරමුණ වී තිබුණි. නමුත් පළාත් පාලන ආයතන හා අනෙකුත් බාහිර ආයතනවලින් ලැබෙන කසල දළ වශයෙන් දිනකට ටොන් 500 ක් පමණ ප්‍රමාණයක් අවිධිමත් ආකාරයෙන් කරදියාන ඉඩමට බැහැර කර තිබු අතර, මෙම කසල බැහැර කිරීම නිසා පරිසරයට වන හානිය සම්බන්ධයෙන් මහජනතාවගෙන් හා වෙනත් ආයතනවලින් විරෝධතා එල්ල වී තිබුණි.

(ඇ) බස්නාහිර පළාත් සභාවට අයත් ආයතන 73 ක් විගණකාධිපති විසින් විගණනය කර වාර්තා ඉදිරිපත් කර තිබුණද සභා ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂය සඳහා ආයතන 30 ක වාර්තා පමණක් විමර්ශන සිදුකර තිබුණි.

## 5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික බැංකුවක තැන්පත් කර තිබූ රු. මිලියන 453 ක ආයෝජනය 2008 අප්‍රේල් 28 දිනැති රජයේ ගැසට් නිවේදනය පරිදි සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙත පවරා තිබූ නමුත් ඒ පිළිබඳව බැංකුව සමඟ එකඟතාවයක් අධිකාරිය විසින් ඇතිකරගෙන නොතිබුණි.

(ආ) චීන ණය ආධාර යටතේ පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඇස්පෝල්ට් නිෂ්පාදනය සඳහා භාවිතා කළ හැකි යන්ත්‍ර 2 ක් හා ඊට අවශ්‍ය අනිකුත් උපාංග ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් 2011 නොවැම්බර් මාසයේ බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබූ අතර එම යන්ත්‍රෝපකරණ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගෙන තිබුණේ ආනයනය කොට මාස 08 කට පසු 2012 ජූලි මාසයේදීය. එම යන්ත්‍රවල වගකීම් කාලය මාස 12 ක් වූ අතර ඒ අනුව නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගන්නා විට ඉන් මාස 08 ක කාලයක් ඉක්මවී තිබුණි.

(ඇ) 2006 සැප්තැම්බර් 04 දින සිට කෘෂිකර්ම උපදේශක 11 "ආ" කාණ්ඩයේ තනතුරකට පත්කර තිබූ නිලධාරිනියකගේ සේවය ස්ථිර කිරීමේ කටයුතු සඳහා විභාග ප්‍රතිඵල සනාථ කර ගැනීමේදී ඇය විසින් ඉදිරිපත් කර තිබූ ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (කෘෂිකර්ම) සහතිකය ව්‍යාජ එකක් බව සනාථ වීම නිසා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2012 අගෝස්තු 15 දිනැති ලිපියෙන් ඉහත නිලධාරිනියගේ සේවය අවසන් කර තිබුණි. ඇය ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (කෘෂිකර්ම) පාඨමාලාව සම්පූර්ණ කර නොමැති බව 2010 සැප්තැම්බර් 06 දිනැති ලිපියෙන් අදාල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ විසින් දන්වා තිබුණත් අදාල ලිපිය ලැබී වසර $1^1/_2$ ක් ගතවන තෙක් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම නිසා එදින සිට 2012 මාර්තු 31 දින දක්වා ඇයට රු. 396,159 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. තවද පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ 2012 මාර්තු 16 දිනැති ලිපිය මගින් අදාල නිලධාරිනියගේ සේවය අත්හිටුවා තිබියදීත් 2012 මාර්තු මාසය සඳහාද සම්පූර්ණ වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් පාලන ආයතන නඟාසිටුවීම යටතේ එම ආයතනවලට වැටුප් ප්‍රතිපූර්ණ ලබාදීමේදී පළාත් පාලන ආයතන තමන්ගේ අරමුදල් වලින් නිලධාරීන්ගේ හා සභිකයින්ගේ වැටුප් හා දීමනා ගෙවා පසුව පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු වුවත්, පළාත් පාලන ආයතන වලින් වැටුප් ගෙවීමට කලින් ඉදිරිපත් කරන වැටුප් ලැයිස්තු සඳහා රු. 4,388,965,566 ක මුදලක් 2012 වසරේදී නිදහස් කර තිබුණි.

(ආ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයත් පානදුර නව බස් නැවතුම්පළේ බිම් මහලේ පිහිටි කඩ කාමර 46 න් 2012 දෙසැම්බර් 31 දින වන විට අයවීමට තිබූ මුළු කුලී මුදල රු.3,309,855 ක් වූ අතර, මින් කඩ කාමර 15 ක හිඟ කුලී වසරකට වඩා පැරණි ශේෂයන් විය. තවද 2009 ජනවාරි 01 දින කුලියට දී තිබූ කඩ කාමර අංක 29 හා 30 න් 2013 මාර්තු මාසය දක්වාම කුලී අයකර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ පවත්වා තිබූ 38 වන ජාතික ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩා නිල ඇඳුම් මිලදී ගැනීම වෙනුවෙන් රු.20,000,000 ක් ඇස්තමේන්තු කර තිබූ අතර, අවසන් ක්‍රීඩා තරඟ 2012 නොවැම්බර් 30, දෙසැම්බර් 01 හා 02 දිනවල පවත්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂනයන් කරනු ලැබේ.

(i) අවසන් තරඟ සඳහා ලබා ගන්නා ලද රු.1,485,120 ක් වටිනා නිල ඇඳුම් හා සපත්තු නිසි පරිදි ක්‍රීඩකයින්ට බෙදාදීම සිදු කර නොතිබූ අතර, ක්‍රීඩා ඇඳුම් කට්ටල 142 ක් හා සපත්තු ජෝඩු 62 ක් ක්‍රීඩා උළෙල අවසන් වීමෙන් පසු බෙදාහැර තිබුණි.

(ii) 2012 වර්ෂය සඳහා මිලදී ගත් රු.964,103 ක් වටිනා ටී කමිස 181 ක්, බොටම් 52 ක් හා සපත්තු ජෝඩු 195 ක් 2013 ජනවාරි 31 දින වන විටත් ගබඩාවේ ඉතිරිව

පැවතුණි.

(iii) ක්‍රීඩා ඇදුම් හා සපත්තු, ලැබීම් හා නිකුත් කිරීම් නිවැරදිව ලේඛනගත නොකිරීම නිසා, ඉතිරි ශේෂය හා ගබඩාවේ තථ්‍ය ශේෂය සැසදීමට නොහැකි විය.

(ඇ) 2012 වර්ෂයේදී ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට අයත් මහජන සෞඛ්‍ය පරික්ෂක කොට්ඨාශ 08 ක පාසල් 52 ක ශිෂ්‍යයින් 14,243 දෙනෙකු පරික්ෂා කළයුතු බවට පාසැල් සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් අනුව තහවුරු වුවද, පරික්ෂා කර තිබුනේ සියයට 54.8 කට සමාන ශිෂ්‍යයින් 7,811 දෙනෙක් පමණි. තවද, එම පාසල් ශිෂ්‍යයින් සියයට 7,811 න් 59 කට සමාන ශිෂ්‍යයින් 4,617 දෙනෙකුගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ගැටළු තිබෙන බවට අනාවරණය වී තිබීම තුළ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් විධිමත් කිරීමේ අවශ්‍යතාවය තහවුරු වී තිබුණි.

(ඉ) ඩෙංගු මදුරුවන් මර්ධනය සඳහා 2011 සහ 2012 වර්ෂවලදී ගම්පහ දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල මගින් වැඩ සටහන් පවත්වා තිබූ අතර ඒ සඳහා පිළිවෙලින් රු.3,720,000 ක් සහ රු.3,924,643 ක් වැය කර තිබුණද, 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී ඩෙංගු රෝගීන්ගේ සංඛ්‍යාව සියයට 85.47 කින් වර්ධනය වී තිබුණි.

(ඊ) රෝහල් අවශ්‍යතා සඳහා 2009 නොවැම්බර් 18 දින රු.171,360 කට මිලදී ගෙන තිබුණු ophthalmoscope set 6 ක් 2013 අප්‍රේල් මාසය වන විටද අදාල රෝහල් වෙත නිකුත් නොකර ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල ගබඩාවේ තබා තිබුණු අතර, එම උපකරණවල වගකීම් කාලයද ඉක්ම වී වසර 2 ක කාලයක් ගතව තිබුණි. තවද 2010 සහ 2011 වර්ෂවලදී Occupational Health Units සඳහා මිලදී ගෙන තිබුණු රු.570,826 ක් වටිනා ශල්‍ය වෛද්‍ය උපකරණ අයිතම 27 ක් හා 2009, 2010 හා 2011 වර්ෂ වල මිලදීගෙන තිබූ රු. 742,222 ක් වටිනා වෙනත් ශල්‍ය වෛද්‍ය අයිතම 33 ක් අදාල අංශ වලට නිකුත් නොකර 2013 ජනවාරි වන විටත් ගබඩාවේ තිබුණි.

(උ) පානදුර මූලික රෝහලේ 2007 වර්ෂයේ සිට කල් ඉකුත්වූ සහ භාවිතයෙන් ඉවත් කරන ලද රු.1,199,698 ක් වටිනා ඖෂධ තොගයක් 2011 ජනවාරි මාසයේදී අපහරණය කර තිබූ අතර රු.1,210,184 ක් වටිනා ඖෂධ තොගයක් අපහරණය කිරීම සඳහා 2011 අගෝස්තු 04 දින අනුමැතිය ඉල්ලා තිබුණි. අතිරික්ත ඖෂධ කල් ඉකුත්වීමට පෙර වෙනත් සුදුසු රෝහල්වලට ලබාදීමේ වැඩපිළිවෙලක් රෝහල් බලධාරීන් විසින් ක්‍රියාත්මක නොකිරීම මෙම තත්ත්වයට හේතුවී තිබුණි.

## 5.4 ආර්ථික නොවූ ගනුදෙනු

ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් පාලනය වන රෝහල්වල නේවාසික රෝගීන්ට සහ වාට්ටුවල සේවය කරන කනිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා පිසූ ආහාර සැපයීම වෙනුවෙන් සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේදී මිල ගණන් ඇගයීම සඳහා පාදක කරගත යුතු පිරිවැය ඇස්තමේන්තු ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් පිළියෙල කර නොතිබුණි. තවද ගම්පහ දිස්ත්‍රික්කයේ රෝහල් 9 ක් සඳහා 2013 වර්ෂයේ තිරණය වූ පිසූ ආහාර ටෙන්ඩරයේ මිල ගණන් සමඟ 2012 වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ගෙවා තිබූ වියදම සැසඳීමේදී එම මාසයේ පමණක් රු.750,000 ඉක්මවූ වියදමේ වැඩිවීමක් තිබූ අතර 2013 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී දළ වශයෙන් රු.6,000,000 ඉක්මවූ මුදලක් රෝහල් 9 ක ආහාර ටෙන්ඩර් වෙනුවෙන් වැඩිපුර වැයකර තිබූ බව නිරීක්ෂණය විය.

## 5.5 හඳුනා ගන්නා ලද පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අයකර ගැනිමට, කපා හැරිමට හෝ අත් හැරීමට ඇති වසර 05 ට අඩු සිද්ධි 34 ක හානිය රු. 4,792,454 ක්ද,වසර 5ත් 10 ත් අතර සිද්ධි 42 ක හානිය රු.1,544,876 ක්ද, වසර 10 ට වැඩි සිද්ධි 65 ක හානිය රු.4,625,713 ක්ද ලෙස වූ මුළු අලාභහානි සම්බන්ධයෙන් 2013 අගෝස්තු 31 දින වනවිටත් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) කි.මී. 3.2 ක දිගකින් යුතු මහර නුගේගොඩ කන්ද ලියැද්ද මාර්ගයේ ඇස්පෝල්ට් මෙ. ටොන් 1382.8 ක් ඇතිරීම සඳහා රු. 18,806,080 ක මුදලක් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණද මාර්ගයට අතුරා ඇති ඇස්පෝල්ට් ප්‍රමාණය සම්මත ප්‍රමාණයට වඩා අඩු බව රසායනාගාර පරීක්ෂණවලින් හෙළිවී තිබුණි. පරීක්ෂණාගාර වාර්තා අනුව පවතින ඝනකමට අදාලව මාර්ගය සඳහා සත්‍ය වශයෙන් භාවිතා කළ ඇස්පෝල්ට් ප්‍රමාණය මෙ.ටොන් 1063 ක් වුවත් ගෙවීම් බිල්පත් අනුව සහතික කර ගෙවා ඇති ප්‍රමාණය මෙ. ටොන් 1382.8 ක් වීම නිසා ඇස්පෝල්ට් මෙ. ටොන් 319.8 ක් වෙනුවෙන් රු.4,349,280 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඇ) පුත්තලම දිස්ත්‍රික්කයේ ඇස්පෝල්ට් කොන්ක්‍රීට් සැපයීම, ඇතිරීම හා ඝනවත් කිරීම සඳහා මිල ගණන් කැඳවා තිබූ අතර එහිදී බස්නාහිර පළාත තුළ පවරා ඇති ව්‍යාපෘති ප්‍රමාණය සළකා තවදුරටත් ව්‍යාපෘති පැවරීම ප්‍රායෝගික නොවන බව සඳහන් කර, අවම මිල ගණන් ඉදිරිපත් කළ පෞද්ගලික ආයතනයක මිල ගණන් ප්‍රතික්ෂේප කර දෙවන අවම මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුට ව්‍යාපෘති පැවරීමට ටෙන්ඩර් මණ්ඩලය ගත් තීරණය හේතුවෙන් සිදුවී ඇති මූල්‍යමය පාඩුව රු. 10,813,012 ක් වී තිබුණි.

(ඇ) මාර්ග බලපත් අයිතිය සංශෝධනය කිරීමේදී මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් බස් රථ 03 ක් සඳහා ගාස්තු අය නොකිරීම නිසා රු. 180,000 ක පාඩුවක් සිදුව තිබුණි.

## 5.6 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රෙස්බෙටේරියන් බාලිකා විදුහලේ පරිගණක 15 කින් සමන්විත පරිගණක කාමරය වසරකටත් වඩා කාලයක් වසාදමා තිබුණි.

(ආ) පයාගල බණ්ඩාරනායක විදුහලට පසුගිය වර්ෂවල හා 2012 වර්ෂයේදී ගුණාත්මක යෙදවුම් සඳහා ලැබී තිබුණු රු. 1,555,798 න් රු. 1,357,372 ක් වියදම් නොකිරීම නිසා බැංකු ගිණුමේ ඉතිරිව තිබුණි.

## 5.7 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂය හා ඊට පෙර වර්ෂ සඳහා හිඟහිටි බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට දිරි දීමනා ගෙවීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී තිබුණත්, ඊට පටහැනිව 2012 ඔක්තෝබර් 30 දින තෙක් අයකර ගන්නා ලද හිඟ ගාස්තු සහ දඩ මුදල් පදනම් කරගෙන දිරිදීමනා ගෙවා තිබුණි.

(ආ) පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලබන නමුත්, විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව 2012 වර්ෂය සඳහා රු.6,180,000 ක කාර්යාල කුලියක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි.

(ඇ) ප්‍රධාන ලේකම් කාර්යාලය ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය නොකර, කුලී ගිවිසුමකින්ද තොරව මසකට රු. 40,000 ක කුලී පදනම මත වාහනයක් ලබාගෙන 2009 ජුනි සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 1,720,000 ක කුලියක් ගෙවා තිබුණි.
තවද සමාලෝචිත වර්ෂය තුළ කිසිදු අවස්ථාවක එම වාහනය කාර්යාල පරිශ්‍රයට පැමිණි බව තහවුරු කරන සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට වැටුප් හා දීමනා ගෙවීම සඳහා බස්නාහිර පළාත් සභාවේ 2012 වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් රු. 10,482,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත්, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත විටින් විට සේවකයින් බඳවා ගැනීම නිසා වැටුප් හා දීමනා සඳහා රු. 33,403,566 ක් වැය කර තිබුණි. ඒ අනුව වැටුප් හා දීමනා ප්‍රතිපාදන ඉක්මවීම රු.22,921,566 ක් වී තිබුණි.

(ඉ) ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය නොමැතිව සේවකයින්ගේ ඉතිරිකරගත් නිවාඩු සඳහා සහ සේවකයින්ගේ ප්‍රසාද දීමනා සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අරමුදලින් වාර්ෂිකව ගෙවීම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා පිළිවෙලින් රු. 508,562 ක් හා රු.680,350 ක් බැගින් එකතුව රු. 1,188,912 ක් ගෙවා තිබුණි.

(ඊ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවකයන්/නිලධාරීන් සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් 2012 වර්ෂය තුළදී රු. 10,799,616 ක් ගෙවීම් කර තිබූ නමුත් සේවකයන්/නිලධාරීන් සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම් කිරීමේදී, ඊට අදාල 1997 පෙබරවාරි 03 දිනැති අංක 07/97 හා 08/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සඳහන් පරිදි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඉටුකළ රාජකාරි පිළිබඳ වාර්තාද ගෙවීම් වවුචරය සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 5.8 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

ගංවතුර පාලනය කිරීම, ප්‍රදේශවාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම, පරිසර හිතකාමී ජීවන රටාවක් තහවුරු කිරීම, පාරම්පරික දැනුම හා සංස්කෘතික උරුමය සුරැකීම, කාබනික පොහොර භාවිතා කෙරෙන බෝග වගාව ප්‍රවර්ධනය කිරීම හා විදේශ සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම වැනි කරුණු අරමුණු කරගෙන බරාව නැමති ජෛව විවිධත්ව උද්‍යාන ව්‍යාපෘතිය කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 කට අයත් රජයේ ඉඩම් හෙක්ටයාර් 181 ක් යොදවා ගැනීමට අපේක්ෂා කර 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා විවිධ කටයුතු වෙනුවෙන් රු. 9,164,303 ක් වැය කර තිබුණි. අදාල ඉඩම පවරා දීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු නොකිරීමට 2013 අගෝස්තු 29 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කිරීමත් සමඟම එකී අරමුණු කිසිවක් ඉටුකර ගැනීමට නොහැකි වීම නිසා වැය කළ රු. 9,164,303 ක් අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.

## 5.9 කාර්ය මණ්ඩල පරිපාලනය

### 5.9.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**(අ) පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන**

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | 1,672 | 1,580 | 92 |
| **තෘතීය** | 651 | 567 | 84 |
| **ද්විතීය** | 6,186 | 5,704 | 482 |

| | | | |
|---|---|---|---|
| **ප්‍රාථමික** | 3,662 | 3,488 | 174 |
| **එකතුව** | 12,171 | 11,339 | 832 |

**(ආ) පාසැල් කාර්ය මණ්ඩල**

| | **අනුමත** | **තථ්‍ය** | **පුරප්පාඩු** | **අතිරික්ත** |
|---|---|---|---|---|
| විදුහල්පතිවරු | 1,732 | 1,254 | 478 | - |
| ගුරුභවතුන් | 34,374 | 31,189 | 3,185 | - |
| සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය | 1,051 | 3,054 | - | 2,003 |
| | 37,157 | 35,497 | 3,663 | 2,003 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ඉහළ කළමනාකරණ තනතුරු ඇතුළු විවිධ තනතුරුවල සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් ආණ්ඩුකාරවරයාගේ/පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ගෙන තිබූ අතර, ඉහළ ශ්‍රේණිවල පුරප්පාඩු තනතුරුවලට වැඩ බලන නිලධාරීන් පත් කිරීම දිගින් දිගටම සිදුව තිබුණි.

(ii) කොළඹ කලාපයේ බාලිකා විදුහලක හිටපු විදුහල්පතිණිය 2012 ජනවාරි 12 දින සිට බොරැල්ල කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයට මාරු කර තිබූ නමුත් ඇයට බොරැල්ල කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයෙන් කිසිදු රාජකාරියක් පවරා නොතිබූ අතර, ආයතන සංග්‍රහයෙන් බැහැරව නිවාඩුද අනුමත කර තිබුණි.

(iii) අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සියළු සේවක ගණයන් සඳහා බඳවාගැනීමේ පටිපාටියෙන් නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් නොපවත්වා නිලධාරීන්ව සිය තනතුරුවල ස්ථිර කිරීම් සිදුකර අඛණ්ඩව වාර්ෂික වැටුප් වර්ධකද ගෙවා තිබුණි.

## 5.10 අසාර්ථක ව්‍යාපෘති

ගෘහ නිර්මාණ කටයුතු හා එහි උපදේශන කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය මගින් සහ ඉදිකිරීම් කටයුතු හා එහි උපදේශන කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් ඉටුකර රු. 68,597,020 ක පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ වැඩ නිමකර තිබූ හෝමාගම බස් නැවතුම්පළ 2012 නොවැම්බර් 21 දින විවෘත කර 2012 දෙසැම්බර් 10 දින සිට ධාවන කටයුතු ආරම්භ කර තිබූ නමුත්, සතියක් ගතවීමටත් පෙර, බස් නැවතුම්පළට බස් රථ ඇතුළු කිරීමට නොහැකි තත්ත්වයට පත් වීම නිසා, 2012 දෙසැම්බර් 18 දින සිට ධාවන කටයුතු නැවත පැරණි නැවතුම්පළට අනුයුක්ත කර තිබුණි.

## 5.11 පළාත් පාලන බල මණ්ඩල කටයුතු අධීක්ෂණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නවවන උපලේඛනයේ 4.2 ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයන්ගේ අධීක්ෂණය පළාත් සභාව වෙත පැවරී තිබුණද, පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. පළාත් පාලන බල මණ්ඩල මූල්‍ය ප්‍රකාශන විගණනයේදී අනාවරණය වී තිබූ කරුණු පළාත් පාලන බල මණ්ඩල ප්‍රධානීන්ගේ අවධානයට යොමු කර තිබූ අතර පළාත් පාලන බල මණ්ඩල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයා විසින් විගණන මතය ව්‍යාවනය කර ඇති අවස්ථා පිළිබඳ සමාලෝචිත වර්ෂය ඇතුළුව ආසන්න වසර 04ක තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | විගණනය කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව | විගණන මතය ව්‍යාවනය කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව |
|---|---|---|
| 2008 | 48 | 22 |
| 2009 | 48 | 22 |
| 2010 | 48 | 13 |
| 2011 | 48 | 20 |
| 2012 | 48 | 26 |

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව පළාත් පාලන බල මණ්ඩල 48 හි හිඟ ආදායම රු. 6,585,240,826 ක් වී තිබුණි.

(ඇ) පළාත් පාලන බල මණ්ඩල 12 ක නිලධාරීන්ට / වෙනත් අයවලුන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර අනුව 2012 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර වල අගය රු. 31,248,292 ක් වී තිබුණි.

(ඈ) පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කිරීමේදී පළාත් පාලන ආයතන දක්වා තිබූ අඩු සැලකිල්ල මත විශාල ප්‍රමාදයක් සිදුවීම නිසා හිඟ මුදල්වල වර්ධනයක් නිරීක්ෂණය වන අතර 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 20 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනවලට ගෙවනු ලබන ප්‍රදාන වලින් එම හිඟ මුදල් අඩු කර ගැනීමට ප්‍රතිපාදන සළසා තිබුණත් එම හිඟ මුදල් අඩු කර අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2013 ඔක්තෝබර් 31 දිනට ගෙවියයුතු දායක මුදල් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතන ගණන | 2013 ඔක්තෝබර් 31 දිනට ගෙවියයුතු මුදල |
|---|---|---|
| | | රු. |
| කොළඹ | 13 | 386,205,450 |
| ගම්පහ | 19 | 23,957,956 |
| කළුතර | 14 | 64,730,056 |
| | 46 | 474,893,462 |

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 සංයුක්ත සැලැස්ම

පළාත් සභාව විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මට 2011 හා 2012 වර්ෂ ඇතුළත්ව නොතිබුණි.

### 6.2 ක්‍රියාකාර් සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත් සභාව සඳහා ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 6.3 අභ්‍යන්තර විගණන

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන වැඩසටහන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 6.4 විගණන හා කළමනාකරණ කමිටු

පළාත් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුවල ක්‍රියාකිරීත්වය දුර්වල මට්ටමක පැවතුනි.

### 6.5 විගණකාධිපතිවරයාගේ වාර්තා සභාගත කිරීම.

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂයන්හි බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කළ දිනය | සභාගත කළ දිනය |
|---|---|---|
| 2008 | 2009.12.10 | 2010.02.09 |
| 2009 | 2010.10.26 | 2013.01.08 |
| 2010 | 2012.01.16 | 2012.05.22 |
| 2011 | 2013.02.28 | 2013.12.03 |

## 7. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය
(ඇ) පළාත් සභා සංවර්ධන සැලැස්ම
(ඈ) අභ්‍යන්තර විගණනය
(ඉ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය
(ඊ) සේවක මණ්ඩල කළමනාකරණය